රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 5/89

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1989 ජනවාරි මස 26 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ නිලධාරීන් සඳහා විශේෂ අත්තිකාරම්.

පහත සඳහන් රජයේ නිලධරයනට 1989 වර්ෂය සඳහා පොලී රහිත රු. 1000/= ක විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට තීරණය කර ඇත.

(අ) මාණ්ඩලික ශ්‍රේණිවලට අයත් නොවන රජයේ සියළුම ස්ථිර නිලධරයන්, (මාණ්ඩලික ශ්‍රේණියට අයත් නොවන නිලධාරියෙක් යනු, නව ආරම්භක වාර්ෂික වැටුප රු. 27000/= ට අඩු හා වාර්ෂික වැටුප් වර්ධකය රු.600/= ට අඩුවන රජයේ නිලධරයෙකි.)

(ආ) අත්තිකාරම් ගෙවීමේ දිනට පූර්වාසන්නයේ අන් මසකට නොඅඩු කාලයක අඛණ්ඩ සේවාවක් ඇත්තාවූ ද, ණය මුදල ආපසු අයකර ගත යුතු සම්පූර්ණ කාල සීමාව තුලදී එනම්, අඩු වශයෙන් 1989 දෙසැම්බර් අවසානය දක්වා, අඛණ්ඩ සේවයේ යෙදවීමට නිශ්චිත වශයෙන් අවකාශ ඇත්තාවූ ද, මාණ්ඩලික නොවන තාවකාලික හෝ අනියම් පදනමක් මත සේවය කරන නිලධරයන්,

02. මෙම අත්තිකාරම් ගෙවීම 1989.02.01 වන දිනෙන් පටන් ගෙන 1989.03.31 වන දිනෙන් අවසන් කළ යුතුය.

03. මෙම අත්තිකාරම් මුදල "රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම්" ගිණුමෙන් හර කළ යුතුය.

04. මෙම අත්තිකාරම් මුදල සමාන මාසික කොටස් දහයකින් (10) අයකර අදාල අත්තිකාරම් ගිණුමට බැර කළ යුතුය.

05. මෙම අත්තිකාරම් ගෙවීමේදී දැනට අනුමත කර ඇති සීමාවන් ඉක්මවීමක් සිදුවන්නේ නම්, සීමාව සංශෝධනය කර අනුමත කරවා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

06. මෙම අත්තිකාරම් මුදල සම්බන්ධයෙන් අඩු කර ගැනීම් ආයතන සංග්‍රහයෙහි XXIV පරිච්ඡේදයේ 3 වන වගන්තියේ සහ අංක 238 වැනි මුදල් රෙගුලාසියෙහි සඳහන් වන 33 1/3% හෝ 40% සීමාවෙන් නිදහස්ය.

07. මෙම අත්තිකාරම ගෙවීම සඳහා ඇපකරුවන් අවශ්‍ය නොවේ.

08. පිටතට මාරු කෙරෙන නිලධාරියෙකු සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුමෙන් දෙන අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමේ සාධනයෙන් අනුගමනය කරන ක්‍රියා පරිපාටිය අනුගමනය කළයුතු ය.

09. මෙම වැටුප් අත්තිකාරම ලබා ඇති නිලධරයෙකුගේ සේවය අවසන් කළහොත් ණය මුදලින් එතෙක් නොගෙවා ඇති ශේෂය එම නිලධාරියාගේ විශ්‍රාම වැටුපෙන්/ සේවක අර්ථසාධක අරමුදලෙන්/ ඇප මුදලෙන්/ පාරිතෝෂිකයෙන් හෝ නීත්‍යානුකූලව එවැනි අයකිරීමක් කළහැකි, ඔහුට ගෙවිය යුතුව ඇති වෙනත් මුදල් වලින් හෝ අයකර ගැනීමට අදාල [illegible] ආයතනවල ගෙවීම් සහ ආයතන ඒකක වග බලා ගත යුතුය.

10. මෙම අත්තිකාරම් ගෙවනු ලබන්නේ අංක 293 හා 1985.06.03 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ ගෙවනු ලබන ණය/අත්තිකාරම් වලට අමතරවය.

11. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරන ලදි.

(එම්. ඒ. ජුනයිඩ්)
ආයතන අධ්‍යක්ෂ.